678.4.62

# සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන ව්‍යාපාරය


ආර්. පී. එම්. ද සොයිසා විසිනි

(නියෝජ්‍ය ප්‍රධානියා, උපදේශකසේවා දෙපාර්තමේන්තුව)


## හැඳින්වීම

උසස් වර්ගයේ රබර් ෂීට් නිෂ්පාදනය වැඩි කිරීමේ හා දියුණු කිරීමේ පරමාර්ථයෙන්, කුඩා රබර් ඉඩම් හිමියන්ට උසස් ආර්ථික පදනමක් බිහි කරන ලද්දේ සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන ව්‍යාපාරයෙනි.

## ව්‍යාපාරයේ ඉතිහාසය

කුඩා රබර් ඉඩම් හිමියන්ගේ නිෂ්පාදන තත්ත්වය වැඩි දියුණු කිරීම සඳහා, 1940 වර්ෂයේ සිටම කීපවරක් ප්‍රයත්න දරා ඇති නමුත්, ඉන් එතරම් ප්‍රගතියක් අත් නොවීය. සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන ව්‍යාපාර සම්බන්ධ යෝජනාව ඉදිරිපත් වූයේ 1969 දීය. නමුත් එය ක්‍රියාත්මක කිරීම සඳහා අනුමැතිය ලැබුනේ 1970 දීය.

1970 වර්ෂයේදී මධ්‍යස්ථාන 5ක් සඳහා ආධාර දීමනා සහ ණය මුදල් වශයෙන් අවශ්‍ය වන අරමුදල් සැපයීමට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය තීරණය කරන ලදී. ඒ අනුව එම මධ්‍යස්ථාන පිහිටුවිය යුතු ස්ථාන ගැන සොයා බැලීමේ සමීක්ෂණයක්ද ඇරඹිණ. සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන 20ක් සංවිධානය කිරීම සඳහා අවශ්‍ය දීමනාවක් 1972 දී ඇස්තමේන්තු වලට ඇතුලත් කරන ලදී.

1972 වර්ෂය අවසන් වන විට සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන 20 ක් ද, 1973 දෙසැම්බර් අවසන් වන විට සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන 50 ක්ද, 1974 දෙසැම්බර් මස අවසන් වන විට මෙම මධ්‍යස්ථාන 30 ක්ද, හා 1975 දෙසැම්බර් මස අවසන් වන විට 20 ක්ද, 1976 දෙසැම්බර් මස අවසන් වන විට මධ්‍යස්ථාන 25 ක් ද වශයෙන් සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන 145 ක්, පිහිටුවීම මූලික සැළැස්මේ අරමුණ විය.

ප්‍රථම වර්ෂයේදී මිල්ලෙණිය, යටලමත්ත, තුගදණ්ඩ/ඉහලගම, ගෝවින්න සහ දන්ගම්පොල යන සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන 5 ආරම්භ කරන ලදී.

1975 දෙසැම්බර් මස අවසන් වන විට සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන 105 ක් ඉදිකළ යුතුව තිබුණි.

1976 අගෝස්තු මස වන විට වැඩ නිමවී නිෂ්පාදන කටයුතු ආරම්භ කර ඇති සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන 78 කි. විවෘත කිරීමට සූදානම්ව සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන 7 ක් ඇති අතර, දැනට සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන 20 ක ඉදිකිරීමේ කටයුතු කරගෙන යනු ලබයි.

නිශ්චිත සැළැස්මට සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන 8 ක් ඇතුලත් වන අතර, මධ්‍යස්ථාන 16 ක සමීක්ෂණ කටයුතු අවසන් කර ඇත. තවත් මධ්‍යස්ථාන 13 ක සමීක්ෂණ කටයුතු කරගෙන යනු ලබයි.

## මධ්‍යස්ථාන පරිපාලනය

සියළුම සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන පාලන කමිටුවක් මගින් ක්‍රියාත්මක වේ. මෙම කමිටුවට නියෝජිතයන් තෝරාගනු ලබන්නේ එම මධ්‍යස්ථානය පිහිටි ප්‍රදේශය අවට ඇති, කිරි සපයනු ලබන, සමිතියේ සාමාජිකයන් වී ඇති අයගෙන් සෑම ගමක්ම නියෝජනය වන පරිදිය. එම කමිටුවට සාමාජිකයන් 7-9 පමණ ඇතුලත් වනු ඇත. පළාතේ රබර් උපදේශක තැනද මෙම කමිටුවට නම් කරනු ලැබේ. මෙම කමිටුවෙන් සභාපති, උපසභාපති, ලේකම් හා භාණ්ඩාගාරික යන අය තෝරාගනු ලැබේ. ගොඩනැගිලි ඉදිකිරීමේ කටයුතු

කෙරෙන අවධියේදී නිතර නිතර එනම් මසකට දෙවරක් පමණ මේ කමිටුව රැස්වේ. සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානයේ පාලනයට අදාළ සියළුම කරුණු ගැන මෙහිදී සාකච්ඡා පැවැත්වේ. වාර්ෂික මහා සභා රැස්වීමට ප්‍රාදේශීය උපදේශක නිලධාරී තැන හා ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ නිලධාරීන්ද සහභාගී වනු ලැබේ. එහිදී අය වැය පිළිබඳ ශේෂ පත්‍රය ඉදිරිපත් කරනු ලබන අතර, නව වර්ෂය සඳහා නව නිලධාරී මණ්ඩලයක් තෝරා පත්කර ගැනීමද කරනු ලැබේ.

### රජයේ සහභාගිත්වය

ක්ෂෙත්‍ර සමීක්ෂණය අවසානයේදී නිලධාරී මණ්ඩලයක් තේරීමද, මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය ගොඩනැගිලි තැනීම සඳහා බිමක්ද, ණය ගැනීමේ කටයුතුද ඉටු කරනු ලැබේ. සෑම සමූහ සැකසුම් මධ්‍යස්ථානයකටම ආපසු නොගෙවනු ලබන ආධාර දීමනාවක් වශයෙන් රු.8,000 ක් සහ ආපසු ගෙවිය යුතු ණය වශයෙන් රු. 12,000ක් රජයෙන් ලැබෙනු ඇත. සමිතියේ ගොඩනැගිලි තැනීමේ කටයුතු කෙරෙන අවධියේදී මෙම රු. 20,000 මුදල කොටස් වශයෙන් ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයෙන් ගෙවනු ලබයි. මධ්‍යස්ථානයේ ගොඩනැගිලි තැනීමටත්, රෝල් ජෝඩුව සහ අනෙකුත් අවශ්‍ය උපකරණ මිළට ගැනීමටත්, ක්‍රියාකාරී පිරිවැය වශයෙන් රු. 1,500/-ක් වෙන් කර තැබීමටත් මෙම මුදල සෑහේ යයි බලාපොරොත්තුවේ.

1975.12.31 වෙනි දින දක්වා සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන ව්‍යාපාරය සඳහා රජයෙන් ලැබුණු සම්පූර්ණ මුදල රු. 2,690,111.63 ක් වේ. මින් 1975.10.31 වෙනි දින දක්වා රුපියල් 2,303,861.93 ක් වැය කර ඇති අතර, මෙම යෝජනා ක්‍රමය අවසන් කිරීමට ඉතිරිව ඇති මුදල රු. 386,249.70 ක් වේ.

අපනයනය සඳහා වසරකට ටොන් 35,000ක් පමණ නිපදවන, සාමාන්‍යයෙන් අක්කර 1.4 පමණ වන අක්කර 10 ට අඩු කුඩා ඉඩම් 1,49,000 මෙහි වේ. මෙම කුඩා ඉඩම් හිමියන් විසින් නිපදවනු ලබන ෂීට් නො.3 වර්ගයට ගැනෙන බව රබර් වෙළඳ ව්‍යාපාරයේ නියැළී සිටින බොහෝ දෙනෙකු විසින් වටහාගෙන ඇත. සුළු පරිමානයෙන් ක්‍රියාත්මක වන බැවින්, උසස් වර්ගයේ ෂීට් නිපදවීම සඳහා අවශ්‍ය ඇඹරීමේ හා දුම්ගැසීමේ පහසුකම් වලින් සමන්විත වීමට මොවුන්ට හැකියාවක් නැත. කුඩා රබර් ඉඩම් හිමියන් ඔවුන්ගේ රබර් නිෂ්පාදනයේදී ප්‍රයෝජනයට ගනු ලබන්නේ අබල දුබල වූ පැරණි රෝල් නිසා, සම ප්‍රමාණයකට නොමැති ගනකම වැඩි ෂීට්, නො. 1 ෂීට් වලට වඩා බොහෝ සෙයින් අඩු මිළකට විකිණීම කරනු ලැබේ. මෙම සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන සංවිධානය කිරීමට රජය තීරණය කළේ එමගින් කුඩා ඉඩම් හිමියන්ට ප්‍රායෝගික වශයෙන් සහාය වී ඔවුන්ගේ නිෂ්පාදනවල තත්ත්වය වැඩි දියුණු කිරීමටයි.

### සමූහ සැකසුම් මධ්‍යස්ථාන වල ක්‍රියාකාරිත්වය

ක්‍රමානුකූලව පවත්වාගෙන යනු ලබන සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානයකින් කිරි රාත්තල් 700 ක් පමණ සැපයිය හැකි, සාමාජික සංඛ්‍යාව 40-45 අතර වූ ගණනකට සේවයක් ලබා දිය හැක. සෑම සමිතියකම රු. 90/- ක් රු. 125/- ත් අතර වැටුපකට පත්කරනු ලැබූ කළමනාකරු/රබර් සාදන්නකු වේ. කිරි රාත්තල් 600ක් පමණ ලැබෙන සමිතියක දෛනික වැටුප රු. 5/-ක හෝ රු. 6/-ක ගෙවීමකින් යුත් සේවකයන් දෙදෙනෙක් හා අනියම් සේවකයන් දෙදෙනෙකු වේ. සාමාන්‍යයෙන් පිරිමි සේවකයන් ෂීට් රෝල් කිරීම ආදිය කරන අතර, දිනකට රුපියලක් පමණ වන සුළු මුදලක් ගෙවීමෙන් අර්ධ කාලීන පදනමක් මත කිරි මුදවන තැටි හා අනෙකුත් උපකරණත් මධ්‍යස්ථානය හා ඒ අවට පිරිසිදුව තබා ගැනීමත් සඳහා ගැහැණු සේවකයන් තුන් හතර දෙනෙකු යොදා ගනු ලැබේ. කළමනාකරු පොත්පත් නඩත්තු කර මුදල් කටයුතු වලට භාණ්ඩාගාරික තැනට හා රබර් උපදේශක තැනට සහාය වෙයි. දිනපතාම ගණන් හිලව් තබන අතර, මසකට දෙවරක් රබර් අලෙවි කරනු ලැබේ. සාමාන්‍ය නිෂ්පාදන වියදම ගණන් බලා සාමාන්‍ය අලෙවි මිළෙන් එම නිෂ්පාදන වියදම ඉවත් කර ඉතිරි මුදල සමිතියට සපයන ලද කිරි ප්‍රමාණය අනුව සාමාජිකයනට ගෙවනු ඇත. සමිතියෙන් ලැබෙන ලාභ සාමාජිකයන් අතර බෙදා දෙනු ලැබේ. දිනකට රාත්තල් 600 ක් එකතු කරන ලබන සමිතියක වියදම් පහත සඳහන් පරිදි වේ.

| | දිනකට | රාත්තලකට වියදම ශත |
|---|---|---|
| | රු. ශත | |
| මසකට රු. 120/– බැගින් කළමනාකරු/රබර් සාදන්නාගේ වැටුප | 6.00 | 01 |
| දිනකට රු. 6/– බැගින් සේවකයන් 4 ට වැටුප | 24.00 | .04 |
| දිනකට රු. 1/– බැගින් ගෙවා පැය 1 1/2 ක් පමණ සේවය කරන ගැහැණු 4 දෙනෙකුට වැටුප | 4.00 | .00 2/3 |
| බෝතලයක් රු. 9/– බැගින් කිරි රා. 600 ක් සකස් කිරීමට අවශ්‍ය අම්ල වලට | 27.00 | .04 1/2 |
| වෙනත් රසායන ද්‍රව්‍ය ආදියට | 6.00 | .01 |
| රාත්තල් 600 ක් වියළීම සඳහා කියුබ 1 ක් වනසේ රු. 15/– බැගින් දර කියුබ එකක් සඳහා වියදම | 15.00 | .02 1/2 |
| ප්‍රවාහන වියදම් | | .00 3/4 |
| රක්ෂණ වියදම්. (වසරකට රු. 150/–) | .75 | .00 1/4 |
| දෛනික වියදම් | | .00 1/3 |
| මුළු වියදම | | .15 |
| ආරක්ෂිත අරමුදල සඳහා | | .01 |
| ණය වාරිකයන් සඳහා | | .02 |
| එකතුව | | .18 |

සමූහ සැකසුම් මධ්‍යස්ථානයක සාමාජිකයෙක් නොවන කෙනෙකුගේ නිෂ්පාදන වියදම්:-

(රබර් රාත්තලක් නිපදවීම සඳහා)

| | ශත |
|---|---|
| ෂීට් ඇඹරීම සඳහා | .05 |
| අම්ලවලට | .06 |
| දුම්ගැස්සීමට | .05 |
| ප්‍රවාහණ ගාස්තු | .02 |
| මුළු වියදම | .18 |

### මධ්‍යස්ථානවලින් ආර්ථිකව ලැබෙන වාසි

සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානවල නිපදවනු ලබන දුම්ගැසූ දර රොටිවල සාමාන්‍ය අලෙවි මිළ රාත්තලක් රු. 1.90 ක් යයි සිතමු. මධ්‍යස්ථානයේ සකස් කිරීමට සහ අලෙවියට සාමාන්‍ය නිෂ්පාදන වියදම ශත. 18 ක් වේ. එවිට මධ්‍යස්ථානයේ සාමාජිකයෙකුට ගෙවනු ලබන ඉතිරි මුදල රු. 1.72 ක් වෙයි. නමුත් ශ්‍රෙණි 3 සහ 4ට අයත්වන කුඩා ඉඩම් හිමියන් විසින් නිපදවනු ලබන රබර් වල සාමාන්‍ය මිල රු. 1.75 ක් වුවහොත්, සකස් කිරීමට හා අලෙවි කිරීමට (නිෂ්පාදන වියදම) ශත 18 ක් අඩු කළ පසු රබර් අලෙවියෙන් කුඩා ඉඩම් හිමියාට ලැබෙන ඉතිරි මුදල රු. 1.57 ක් වේ. මේ අනුව සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානයක සාමාජිකයෙකු වීමෙන් තමන්ගේ රබර් සඳහා වැඩිපුර ශත 15 ක් ලබා ගැනීමට කුඩා ඉඩම් හිමියාට පුළුවන් වනු ඇත.

### නිෂ්පාදන අලෙවියට ඇති බාධා

සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන ව්‍යාපාරය වැඩි දියුණු කර එය පුළුල් කිරීමට ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය දැනට වැඩ සටහනක් පිළියෙල කරගෙන යනු ලැබේ. දැනට සෑම මධ්‍යස්ථානයකටම බලපාන බැරෑරුම් ප්‍රශ්නය වී ඇත්තේ දුම් ගැසූ දර රොටි අලෙවියයි. මෙම රබර් වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුවේ ගබඩා වලටත්, සමූපකාර සමිති වලටත්, අවසරලත් පුද්ගලික රබර් වෙළෙන්දන්ටත් අලෙවි කළ හැක. එය එසේ වුවත්, මෙම සමිතිවල

සාමාජිකයන් ඒවා වෙළඳ ද්‍රව්‍ය මිළට ගැනීමේ දෙපාර්තමේන්තුවේ ගබඩා වලට විකිණීමට වැඩි කැමැත්තක් දක්වති. එනමුත් ගබඩාවල ඉඩකඩ මදිකම නිසාත්, නිසි කලට මුදල් ආදිය නොමැති වන නිසාත් රබර් අලෙවිය අපහසු තත්ත්වයක තිබීම අවාසනාවන්ත කරුණක් වී ඇත.

සමුපකාර සමිති රබර් මිළට ගනු ලබන්නේ වට්ටම් සහිතව බැවින් මෙම සමිති එවැනි අඩු කිරීමක් ඇතිව රබර් අලෙවි කිරීමට අකමැතිය. පුද්ගලික වෙළෙන්දන්වද මුදල් නොමැති කමින් එවෙලේම මුදල් ගෙවා රබර් මිළට ගැනීමට පුළුවන් කමක් නැත. එසේ වූ විට තම සාමාජිකයනට මුදල් ගෙවීමට සති ගණන් බලා සිටීමට සමිතිවලට සිදුවනු ඇත.

**ව්‍යාපාරයේ දියුණුවට අනාගත අපේක්ෂාවන්**

සැම සමිතියකටම ක්‍රියාකාරී පිරිවැය වශයෙන් වෙන් කර තබනු ලබන රු. 1,500/- මුදල අම්ල (ඇසිඩ්), දර ආදිය මිළට ගැනීමට හා කිරි සපයනු ලබන සාමාජිකයනට මුදල් අත්තිකාරම් දීමට ප්‍රමාණවත් නොවේ. සැම සමිතියකම දිනපතා භාර ගනු ලබන කිරි ප්‍රමාණය වැඩිකරගත හැක්කේ සමිතිය සතු කිරි මුදවන තැටි ප්‍රමාණය වැඩි කරගතහොත් පමණක් බවද පෙනී ගොස් ඇත. කලින් සඳහන් කළ පරිදි සමිතියට අවශ්‍ය උපකරණ ආදිය අළුතින් මිළදී ගැනීමට ඒවාට මුදල් නොමැත. කළවම් නොකළ හොඳ අම්ල නිසි පරිදි සැම විටම ලැබෙන්නේ නම් සමිතිවල මනා ක්‍රියාකාරීත්වයට එයද ඉවහල් වේ. ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ නිලධාරීන් කීපදෙනෙකු සමිතිවල විගණක කටයුතු (ගණන් හිලව් පරීක්ෂා කිරීම) සඳහා පුහුණු කළ යුතු අතර, මෙම වැඩ පිළිවෙල පරිපාලනය හා පරීක්ෂාව සඳහා අවශ්‍ය නිලධාරී සංඛ්‍යාවද වැඩි කළ යුතුය. මෙම ව්‍යාපාරය තවදුරටත් පුළුල් කිරීමට ප්‍රථම දැනට පවතින තත්ත්වය වැඩි දියුණු කිරීම හිතකර වේ.

ගොඩනැගිලි ද්‍රව්‍ය හිඟකම හා ඒවා ලබා ගැනීමට ඇති අපහසුව නිසා සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානවලට මින්මතු අවශ්‍ය වන ගොඩනැගිලි ද්‍රව්‍ය තරඟකාරී මිළ ගණන් වලට සැපයීමේ වැඩ පිළිවෙලක් ගොඩනැගිලි ද්‍රව්‍ය සංස්ථාව සමඟ එකඟත්වයකට පැමිණ ඇති කර ගැනීම ඉතා වැඩදායක වනු ඇත.

පළාතේ රබර් සැකසුම් මධ්‍යස්ථානය, රබර් පැල, පොහොර ආදිය බෙදදීමේ මධ්‍යස්ථානයක් කර එය ක්‍රියාශීලි ස්ථානයක් බවට පත් කිරීමෙන් එම මධ්‍යස්ථාන වඩා ඵලදායී තත්ත්වයකට පත්වනු ඇත.

මෙම ව්‍යාපාරය සර්ව සම්පූර්ණ ව්‍යාපාරයක් කර ගැනීම සඳහා සැම විටම ඉතා හොඳින් මේ සම්බන්ධ සියළු කරුණු සොයාබලා ඒවා සකස් කර ඇත. පළමුකොට, පළාතේ රබර් උපදේශක විසින් සමීක්ෂණයක් පවත්වනු ලැබේ. මෙම සමීක්ෂණයේදී ඉඩම් ප්‍රමාණය, සිටුවා ඇති රබර් වර්ගය පිළිබඳ විස්තර, රබර් ගස්වල වයස සහ ඒවායේ තත්ත්වය, එහි නැවත වගාව පිළිබඳ වැඩ සටහන, කුඩා ඉඩම් හිමියාට කිරි අඹරා ගැනීමට ඇති පහසුකම් ආදිය පිළිබඳව සොයා බලනු ලැබේ.

ක්‍රියාත්මක කිරීමේ පහසුව තකා, සැතපුම් 1/2 – 3/4 ක අර්ධ විෂ්කම්භය ඇති, දිනකට කිරි රාත්තල් 900 ක් ලබා ගත හැකි ප්‍රදේශ වලට පමණක් මෙම සමීක්ෂණය සීමා කර ඇත. සාමාන්‍යයෙන් මෙම සමීක්ෂණයෙන් පසු ඉඩම් අක්කර 120 – 140 අතර ප්‍රමාණයකට මින් සේවයක් ලබා දිය හැක. ඊළඟ පියවර සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානය සඳහා පහසුවෙන් ජලය ලබා ගත හැකි ස්ථානයක් තෝරා ගැනීමයි. එය සමිතියට ඇතුලත් සැම කුඩා ඉඩම් හිමියෙකුටම පොදු වූ මධ්‍යස්ථානයක් විය යුතු අතර කුඩා ඉඩම් හිමියන්ගේ (සාමාජිකයන්ගේ) එදිනෙද ලැබෙන කිරි ඉක්මණින් හා පහසුවෙන් මධ්‍යස්ථානයට ගෙන ඒමේ හැකියාවද, තිබිය යුතුය. මෙම බිම් කැබෙල්ලට පහසුවෙන් ළඟා වීමට හැකි විය යුතු අතර, එය වගුරු හෝ පහත් බිමක් නොවිය යුතුය. පසුගිය වසරේ තනන ලද සැම මධ්‍යස්ථානයක් සඳහාම අවශ්‍ය ඉඩම්, තෑගි වශයෙන් හෝ ඉතා අඩු කුලියට වසර 20 – 25ක පමණ කාලයක බද්දට හෝ ගැනීමට අපහසු කමක් නොවීය.

**ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ අනුග්‍රහය**

ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනයේ රසායන විද්‍යා දෙපාර්තමේන්තුවෙන් සපයනු ලබන නියමිත සැලැස්මක් (ප්ලෑනක්) හා ඒ අනුව පිළියෙල කල අවශ්‍ය උපකරණ ලැයිස්තුවක් අනුව සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානයේ ගොඩනැගිලි තැනීම කරනු ලැබේ. රාත්තල් 3500



3—WT 15833

ධාරිතාවකින් යුත් දුම් ගෙයක්ද, ඉඩකඩ ඇති කිරි මුදවන මඩුවක්ද, කිරි මුදවන තැටි, අම්ල ආදිය සඳහා ගබඩා කාමරයක්ද, දුම් ගැසූ රබර් ෂීට් ගබඩා කර තැබීම සඳහා තවත් ගබඩා කාමරයක්ද මෙයට ඇතුලත් වනු ඇත. මෙම ගොඩනැගිලි තැනීමේ කටයුතු වලට මග පෙන්වීම හා ඒවා පරීක්ෂා කිරීම ආයතනයේ උපදේශක සේවා දෙපාර්තමේන්තුවේ ක්ෂෙත්‍ර නිලධාරීන් විසින් කරනු ලැබේ. සමිතියට මුදල් මුදවා හැරීම සඳහා පිළියෙල කර ඇති ගිවිසුම් පතකට සමිතියේ නිලධාරීන් අත්සන් තැබීමෙන් පසුව දීමනාවක් වශයෙන් රු. 8,000/- ක් හා සියයට 10 පොළියට රු. 12,000/-ක් ද දෙනු ලැබේ. මෙම මුදල සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානයේ ගොඩනැගිලි සාද නිම කිරීමටත්, රෝල් හා අනෙකුත් අවශ්‍ය උපකරණ මිලදී ගැනීමටත් ප්‍රමාණවත් වන බව සොයා ගෙන ඇත. ගොඩනැගිලි තැනීමේ කටයුතු කෙරෙන අවධියේදී උපදේශක සේවා දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය උපදේශක නිලධාරීන් විසින් වරින් වර කොටස් වශයෙන් මෙම මුදල් මුදා හරිනු ලැබේ. ගොඩනැගිලි තැනීමේ අවධියේදී ඇති ක්‍රියාවලියේ පාලනය ශ්‍රී ලංකා රබර් පර්යේෂණායතනය විසින් කරනු ලැබේ.

සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානයට අවශ්‍ය සේවකයින් ප්‍රදේශයේ කුඩා ඉඩම් හිමියන් අතරින් තෝරාගනු ලැබේ. දුම් ගැසූ දර රොටී නිෂ්පාදනය, පොත්පත් නඩත්තු කිරීම, අලෙවි කිරීම ආදිය ගැන ආයතන නිලධාරීන් විසින් ඔවුනට පුහුණුවක් දෙනු ලැබේ. එයට උපදේශක සේවා දෙපාර්තමේන්තුවේ සහාය දෙනු ඇත. කුඩා ඉඩම් හිමියන්ට අත්තිකාරම් මුදල් ගෙවීම සතියකට වරක් කරනු ලැබේ.

**ව්‍යාපාරය සඳහා විදෙස් ආධාර**

සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථාන ව්‍යාපාරය සඳහා විදේශ ආධාරද ලැබී ඇති බව කෘතඥතා පූර්වකව සිහිපත් කළ යුතුය. එක් සමූහ රබර් සැකසුම් මධ්‍යස්ථානයක් සඳහා 'ඕස්ට්‍රේලියාවේ ප්‍රජා ආධාර' පදනමෙන් රු. 12,700/- ක මුදලක් ලැබුණි.

මෙය සාර්ථක වූ බැවින් එම පදනම විසින්ම 'සාගිනි නිවීමේ ව්‍යාපාර අධිකාරිය' මාර්ගයෙන් තවත් රු. 39,000/- ක් පිරිනමා ඇත. මෙම මුදල විදේශීය විනිමය වැය වන උපකරණ, හා කිරි මුදවන තැටි නිෂ්පාදනය සඳහා අවශ්‍ය 'ඇළුමිනියම්' ලබා ගැනීමට යොදවා ඇත.

## හෙට උදාවන තුරු

සැඳෑ කලුතිර ලොව වසාලූ
වැටුන බොල් වැසි ගත තෙමාලූ
නිසංසල වූ සැඳෑ සමයක
මිලීනව ගිය පහන් සිළුවක
දුහුල් සේයා රැහැන් අතරින්
දුටිමි දුක්වන හදක් තනිවී

පිහි තුඩ මුවහත බලමින්
වසින වැස්සට සාප කරමින්
කිරට හඬනා බිළිඳු පුතුගේ
දුක් සාගිනි නිවා ලන්න
සුසුම් හෙලනා එවන් දැසට
කිරි කට්ටිය ඇත කොනේ
රබර් ගසක් වූ
මාද දුක්වන බව පෙනේවිද

දිනක ධාා බිඳු අහිමි වීමෙන්
පියකු හෙලනා ශෝක සුසුමෙන්
කිරට හඬනා බිළිඳු පුතුගෙන්
නැගෙන දුක් ගී ශෝක රාවෙන්
මගේ ගත කිරි අරයි නිරතුරු
මවක සේ දත්
දරු සෙනෙහසක මහිමය
එවන් සෙනෙහස මහද ඇති බව
දත්තෙ මුවහත පමනි පිහිතුඩ

මන්දරම් තුරල් වෙලා
හිරු රැස් මා ගත වැටිලා
පිහිතුඩ මුවහත බලලා
දඩිය සුලහට හෙලන්න
බලාපොරොත්තුවේ කඩ ඉම
පසෙකට වී බලා හිඳිමු
උදවන තුරු
තවත් දවසක්

හෙටත් අද මෙන් වැසි වසීවිද
පුතුට සාගිනි යලි දූනේවිද
වසින වැසි මා ගත තෙමා විද
තවත් දවසක් උද වේවිද

ශ්‍රීලාල් ගුණසේකර විසිනි
රබර් උපදේශක, බදුරලිය.